# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.22 පැය 0725 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /803/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

### 01. අයිස් මත්ද්‍රව්‍ය,හෙරොයින් හා මත්පෙති සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා අනුරාධපුර කඳවුර.

2025.04.21 වන දින සවස් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ අනුරාධපුර නගරයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා අනුරාධපුර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 120ක්,හෙරොයින් ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 250ක් හා මත්කරල් 390ක්,දුරකතන 04ක් හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් රුපියල් 25000/= ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන අනුරාධපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24ක් වන අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනුරාධපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

### 02. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා සංවිධානාත්මක අපරාධ මඩර්න ඒකකය.

2025.04.21 වන දින සවස් කාලයේ සපුගස්කන්ද පොලිස් වසමේ ගෝනවල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා සංවිධානාත්මක අපරාධ මදර්න ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 37 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන සපුගස්කන්ද පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන ගෝනවල, කැලණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සපුගස්කන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

### 03. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කල සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා නෙල්ලිඅඩි කඳවුර.

2025.04.21 වන දින අළුයම් කාලයේ පේදුරුතුඩුව පොලිස් වසමේ වල්ලිපුරම් තිරුමාල්පුරම් ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා නෙල්ලිඅඩි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර ලොරි රථ දෙකකට පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු ලොරි රථ 02 ක් සමග අත්අඩංගුවට** ගෙන පේදුරුතුඩුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 හා 37 යන වයස්වල පසුවන අයියකච්චි සහ වල්ලිපුරම් ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

පේදුරුතුඩුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.වැටලීමට අදාල ඡායාරූප දෙකක් මේ සමග යොමු කරමි.

## 04. නීති විරෝධී දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි ඒකකය.

2024.04.21 වන දින රාත්‍රී කාලයේ චීනවරාය පොලිස් වසමේ කොඩ්ඩේ ධීවර වරාය තුලදී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ බුද්ධි ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන චීනවරාය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන දෙව්නුවර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

චීනවරාය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. නීති විරෝධී දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර.

2024.04.21 වන දින දහවල් කාලයේ පේරාදෙනිය පොලිස් වසමේ මුරුතලාව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා මහනුවර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පේරාදෙනිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 67 ක් වන මුරුතලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පේරාදෙනිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි

## 06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය.

2025.04.21 වන දින උදෑසන කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේ ගොඩවාන ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 05 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 3600/=ක මුදලක් සමග අත්අඩංගුවට** ගෙන අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන ගොඩවාන, මැලිගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුර.

2025.04.21 වන දින සවස් කාලයේ අළුත්ගම පොලිස් වසමේ පයාගල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 45 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන අළුත්ගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25ක් වන පයාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අළුත්ගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**